වගා සහනාධාර චක්‍රලේඛ අංක: 36

මගේ අංකය: සං/ව.ආ/ප්‍රති V.
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
තැ.පෙ. 1474,
කොළඹ 03.
1992 පෙබරවාරි මස 14 දින.

සියළුම ප්‍රාදේශීය කළමණාකරුවන් වෙත.

**තේ නැවත වගා කිරීම සහ අළුතෙන් තේ වගා කිරීම සඳහා අවසරපත්‍ර ලාභීන්ට ප්‍රදානය කරනු ලබන සහනාධාර දීමනා ගෙවීම සම්බන්ධයෙන් අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙත.**

යථෝක්ත කරුණ සම්බන්ධයෙන් මින් ඉදිරියට පහත සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට සටහන් කර ගන්න.

01. දැනට නිකුත් කර ඇති අවසරපත්‍ර.

(අ) තේ නැවත වගා කිරීම සහ අළුතෙන් තේ වගා කිරීම සඳහා අවසරපත්‍රලාභීන්ට ඔවුන් මෙතෙක් නිසියාකාරව නිම කරන ලද වැඩ අදියර වෙනුවෙන් නියමිත සහනාධාර කොටසක් හෝ ගෙවා ඇත්නම්, ඉතිරි වැඩ අදියර කිරීමට නියමිත කාලසීමාව තුලදී එම කාර්යය සතුටුදායක ලෙස නිම කළහොත්, ඒ සම්බන්ධයෙන් කෙරෙන පරීක්ෂණයකින් අනතුරුව, නියමිත සහනාධාර මුදල් ගෙවිය යුතුය.

(ආ) තේ නැවත වගා කිරීම සහ අළුතෙන් තේ වගා කිරීම සඳහා අවසරපත්‍රලාභීන් විසින් එම අවසරපත්‍ර වලංගු කාලය තුළ නියමිත වැඩ කොටසක් නිම කළ නමුදු, ඒ සඳහා වන සහනාධාර මෙතෙක් ගෙවා නැතිනම්, අවසරපත්‍රලාභියාගෙන් ඉල්ලීමක් ලදහොත්, එවැනි තේ ඉඩම් පුළුල් පරීක්ෂණයකට භාජනය කර, සතුටුදායක ලෙස වැඩ කටයුතු නිම කර ඇත්නම්, සහනාධාර ගෙවිය හැක.

(ඇ) තේ නැවත වගා කිරීම සහ අළුතෙන් තේ වගා කිරීම සඳහා අවසරපත්‍රලාභීන් විසින් එම අවසරපත්‍ර වලංගු කාලය තුළ කිසිදු නියමිත වැඩ කොටසක් නිමකර නැතිනම්, එම අවසරපත්‍ර අළුත් කිරීම අවශ්‍ය වන අතර, ඒ සඳහා 1992 ජුනි 30 වෙනි දිනට පෙර හෝ ඉල්ලීමක් කළහොත්, නිශ්චිත කාලයක් දක්වා එවැනි අවසරපත්‍ර දීර්ස කිරීම සළකා බැලිය හැක.

.....2.

02. <u>1992 වර්ෂයට අවසරපත්‍ර නිකුත් කිරීම.</u>

(අ) <u>තේ නැවත වගා කිරීම.</u>

හෙක්ටයාර් 2.0235(අක්කර 05) කට නොවැඩි බිම් ප්‍රමාණයක් වෙනුවෙන් නිකුත් කරනු ලබන අවසරපත්‍ර සඳහා සහනාධාර ගෙවනු ලැබේ. එහෙත් ඊට වැඩි බිම් ප්‍රමාණයක් වගා කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම සළකා බලනුයේ, අයදුම්කරුවන්හට ඒ සඳහා අවශ්‍ය මූල්‍ය හා මිනිස්බල සම්පත් මෙන්ම ඒ හා සමාන බිම් ප්‍රමාණයක තේ වගා කිරීම සම්බන්ධයෙන් පළපුරුද්ද ඇති බවට ඉදිරිපත් කෙරෙන ප්‍රත්‍යක්‍ෂ සාක්‍ෂි මතය.

(ආ) <u>අළුතෙන් තේ වගාකිරීම:</u>

අළුතෙන් තේ වගා කිරීම සම්බන්ධයෙන් සහනාධාර ලබාදීම හෙක්ටයාර් 0.4047 (අක්කර 01) ක බිම් ප්‍රමාණයකට සීමා කෙරේ. ඒ වුවද, අක්කරයකට වැඩි බිම් ප්‍රමාණයක තේ වගා කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කළහැකි අතර, සහනාධාර ගෙවනු ලබන්නේ, අක්කරයක බිම් ප්‍රමාණයක් සඳහා පමණි. මේ සඳහා මූල්‍ය පහසුකම් අවශ්‍යවේනම්, බැංකු ණය ලබා ගැනීමට අයදුම්කරුවන්ට හිමිකම් ඇති බව පහදා දෙන්න.

පාලනය කළ නොහැකි හේතූන් මත තේ වගා කිරීම හා ඒ සඳහා සහනාධාර ගෙවීම පිළිබඳව මෑතකදී පනවන ලද සීමාවන් සහ නියමයන් ඉහත සඳහන් ප්‍රකාර ලිහිල් කරනු ලබන අතර, මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව අවශ්‍ය කඩිනම් පියවර ගැනීමට සටහන් කරගත යුතුය.

මින් ඉදිරියට කිසිදු හේතුවක් නිසා හෝ තාවකාලික අවසරපත්‍ර නිකුත් නොකළ යුතු බව අවධාරණය කෙරේ.

තවද, තේ නැවත වගා කිරීමේ වැඩ සටහන හා ඉන් අපේක්ෂිත ඉලක්ක සපුරාලීම කෙරෙහි වැඩි ප්‍රමුඛත්වයක් දිය යුතු වන්නේ ය.

මේ සම්බන්ධයෙන් පැන නගින විශේෂ ප්‍රශ්ණ වේනම්, හෝ කිසියම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වුවහොත්, අදාළ කරුණු මැනවින් දක්වමින් උපදෙස් සඳහා සහකාර සාමාන්‍යාධිකාරී (සංවර්ධන) වෙත ඉදිරිපත් කරන්න.

මෙම චක්‍රලේඛය ඔබ වෙත ලැබුණු බවත්, එහි සඳහන් උපදෙස් ක්‍රියාත්මක කිරීමට සටහන් කරගත් බවත් මා වෙත නොපමාව දැනුම් දිය යුතුය.

(එම්. පී. ඩී. පී. ප්‍රනාන්දු)
වැඩ බලන සභාපති.

පිටපත්:-

1. සාමාන්‍යාධිකාරී.
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(වයා)
3. මුදල් කළමණාකරු.
4. අභ්‍යන්තර විගණක.
5. සහකාර සාමාන්‍යාධිකාරී (පා/පි)
6. සියළුම ක්‍ෂෙත්‍ර නිලධාරීන්.